**<u>ඌව පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023 (II අදියර)</u>**

**<u>සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවීම</u>**

1. 2024.03.30 දින පැවති උක්ත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මේ සමග පළ කරනු ලැබේ.

2. බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් පරිදි එක් එක් විෂයයන්හි පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් ලිඛිත තරඟ විභාගය සමත් අයදුම්කරුවන්ගේ කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ 2024.04.27 දින සිට පැවැත්වීමට නියමිත අතර සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් පහත දක්වෙන ලේඛන සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට සූදානම් කර ගත යුතුය.

3. මෙම නාම ලේඛනය සකස් කර ඇත්තේ විභාග අංක අනුපිළිවෙලට වන අතර ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවලට අනුව නොවන බව දැනුම් දෙමි.

4. සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනිමේ සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ නම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරු/අයදුම්කාරිය ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

5. ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන්නේ බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් නිර්නායක අනුව වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වෙත ලිඛිත තරඟ විභාගයේ ලකුණු ලබා නොදෙන අතර ඒ පිළිබඳව ඔවුන් දැනුවත් නැත.

6. ලිඛිත තරඟ විභාගයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුවෙහි කුසලතා පිළිවෙලට පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත්වීම් ප්‍රදානය සඳහා තෝරා ගනු ඇත. (පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව ආබාධිත අයදුම්කරුවන් පිළිබඳව කටයුතු කරනු ලැබේ)

7. අයදුම්කරුවන් විසින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියෙහි පළ කරනු ලබන පුරප්පාඩු පාසල් නාම ලේඛනය අනුව තමන් ඉල්ලුම් කරන ලද විෂයය හා භාෂා මාධ්‍යයට අදාල පුරප්පාඩු පාසල් අතුරින් තමන් පත්වීම් ලැබීමට කැමති පාසල් අදාල ආකෘතියෙන් අනුපිළිවෙලට සඳහන් කර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. තමන් මනාපය පළ කරනු ලබන පාසලක් ලබා දිය නොහැකි නම් පමණක් අයදුම්කරුවන් වෙත පුරප්පාඩු ලේඛනයේ සඳහන් වෙනත් පාසලකට පත්වීම් ලබා දෙනු ඇත.

8. සම්මුඛ හා පරීක්ෂණයට කැඳවනු ලබන දිනය හා වේලාව ඉදිරියේදී අයදුම්කරුවන්ගේ විද්‍යුත් තැපැල වෙත දැනුම් දෙනු ලබන අතර මෙම වෙබ් අඩවියෙහිද පළ කරනු ලැබේ.

- **රැගෙන ආ යුතු ලිපි ලේඛන :-**

I. උප්පැන්න සහතිකයේ මුල් පිටපත (ඡායා පිටපතක් සමඟ)
II. ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය/වලංගු විදේශ ගමන් බලපත්‍රය (ඡායා පිටපතක් සමඟ)
III. අ.පො.ස. (සා.පෙළ) සහතිකවල මුල් පිටපත් (ඡායා පිටපත් සමඟ)
IV. අ.පො.ස. (උ.පෙළ) සහතිකවල මුල් පිටපත් (ඡායා පිටපත් සමඟ)
V. උපාධියේ වලංගු දිනය නිශ්චිතව සඳහන් උපාධි සහතිකය හා උපාධියට හදාරන ලද විෂයය විස්තරය ඇතුළත් ලේඛකාධිකාරී විසින් නිකුත් කළ සහතිකයේ මුල් පිටපත් (ඡායා පිටපත් සමඟ)
VI. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලබන පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස් 04 ආකෘතිය)
VII. 2021, 2022, 2023 වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ උධෘතය
(ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් ලබා ගත් ආකෘතිය අනුව සම්පූර්ණ කර රැගෙන එන්න. ඌව පළාතේ වසර 03ක පූර්වාසන්න ස්ථිර පදිංචිය තහවුරු කළ නොහැකි අයදුම්කරුවන් තම කලත්‍රයාගේ ඌව පළාත තුළ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචිය සනාථ කරන ඡන්ද හිමි නාමලේඛන උධෘත හා විවාහ සහතික ඉදිරිපත් කළ යුතුය. එවැනි අයදුම්කරුවන් පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචි නොවුවද අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ඌව පළාතේ තම ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.)
VIII. ග්‍රාම නිලධාරී සහතිකය හැර පසුගිය ආසන්න මාස 06ක කාලයක තුළ දී ලබා ගත් චරිත සහතික 02ක්
IX. සහතිකවල නමෙහි වෙනස්කම් තිබේ නම් දිව්රුම් ප්‍රකාශයක්
X. රජයේ සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා නිකුත් කළ සේවා සහතිකයක්
XI. ආබාධිත අයදුම්කරුවන් ඒ බව සනාථ කරන වෛද්‍ය සහතික
XII. පත්වීම් ලැබීමට මනාපය පළ කරනු ලබන පුරප්පාඩු පාසල් ඇතුළත් ආකෘති
XIII. ඔබගේ විස්තර ඇතුළත් කර සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය (ආකෘති පත්‍රය වෙබ් අඩවියේ පළ කර ඇත)